**තුම්පනේ ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂය දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව,රු.6,835,682 ක් වුවත්, එය රු.6,822,150 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන්, රු.13,532 ක් අඩුවෙන් දක්වා තිබුණි.**

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

**(අ) ලැබිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 9 ක එකතු වටිනාකම රු.18,304,322 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.4,132,368 ක් වී තිබුණි.**

**(ආ) ගෙවිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට රු.21,050,036 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකමින් රු.15,924,293 ක් කර්මාන්ත ණයහිමියෝ වූ අතර, වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.12,759,432 ක් විය.**

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| i | 5(11) රීතිය | සභාවේ මාර්ගස්ථ මුදල් හා ගොඩනැගිලි රක්ෂණය කර නොතිබුණි. |
| ii | 19 රීතිය | සියලුම උප පත්‍රිකා පොත් සභාවේ ලේකම් භාරයේ පැවතිය යුතු වුවත්, ප්‍රධාන ලිපිකාරිනිය භාරයේ තිබුණි. |
| iii | 207 රීතිය | ගබඩා ද්‍රව්‍ය සැපයීම හැකිතාක් දුරට පොදු තරඟකාරීත්වයක් අනුව සිදු කිරීමට ක්‍රියා කළ යුතු වුවත්, ඊට පරිබාහිරව අවිධිමත්ව මිල ගණන් සකස් කර රු.76,150 ක මිල දී ගැනීම් සිදු කර තිබුණි. |
| iv | 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර ඒවා සුරක්ෂිත කිරීමට ද කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i | මු.රෙ.110 | සභාවේ වාහන හා වෙනත් දේපළවලට හානි සිදු වූ බව වාර්තා වී තිබුණ ද, අදාළ හානි, ලේඛනගත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii | මු.රෙ.371(2)(ඇ) | 2009 වර්ෂයේ සිට 2015 ජනවාරි දක්වා කාලයට අදාළව අවස්ථා 6 කදි ලබා දී තිබූ රු.923,289 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| iii | මු.රෙ.571(3) | 2010, 2011 හා 2012 වර්ෂවලට අදාළව අවස්ථා 17 කදී තැන්පත් කර තිබූ රු.259,020 ක තැන්පතු නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ.

----------

| | | |
|---|---|---|
| i | 2001 අගෝස්තු 07 දිනැති අංක 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වගන්තිය | සභාවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| ii | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7 ඡේදය | ගලගෙදර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 6 ක් අතුරු බදු දී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

---------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,456,901 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,788,128 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.1,668,773 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

**-----------------------**

**2.2.1 වරිපනම්.**

**----------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.410,548 ක් වූ අතර, ඉන් වර්ෂය තුළදී රු.172,731 ක් අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කළ ආදායම රු.881,903 ක් වූ අතර, ඉන් රු.675,623 ක් අය කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර ගැනීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 42 ක් හා සියයට 76 ක් වූ අතර, දෙසැම්බර් 31 දිනට හිග ශේෂය රු.444,097 ක් විය.**

**(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.16,372 ක වරිපනම් බදු වර්ෂ 5 ක පමණ කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ඇ) 2004 වර්ෂයේ දී කරන ලද වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් අය කර තිබුණි.**

**2.2.2 බදු කුලී.**

**----------**

**(අ) ඉදිකිරීමට යෝජිත වෙළඳ සංකීර්ණවල කඩ කාමර බදු දීම.**

**------------------------------------------------------------**

**ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් හෝ ඇස්තමේන්තු හෝ පිළියෙළ කිරීමකින් තොරව ගලගෙදර මඩිගේ වෙළඳ සංකීර්ණය, හතරලියද්ද පොදු වෙළඳ පොළ හා අලුදෙණිය මහජන පුස්තකාලය ඉදිරිපිට කඩ කාමර 9 ක් බදු දීමට රු.18,398 ක් වැය කර පුවත්පත් දැන්වීමක් පළ කර, ටෙන්ඩර් කැඳවා කඩ කාමර 3 ක් සඳහා ටෙන්ඩර්කරුවන් තෝරා ගෙන වෙළඳ අයිතිය පැවරීම සඳහා එක වර ගෙවීමේ ටෙන්ඩර් මුදල් ලෙස බදුකරුවන් දෙදෙනෙකුගෙන් රු.512,000 ක මුදලක් ලබා ගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.**

**(ආ) ගිවිසුම්වලට එළඹීමෙන් තොරව කඩ කාමර බදු දීම.**

**---------------------------------------------------------**

**ගිවිසුමකට එළඹීමකින් තොරව කඩ කාමර 15 ක් බදු දී තිබුණි.**

**(ඇ) හිඟ කඩ කාමර කුලී.**

**----------------------**

**සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කඩ කාමර 44 කින් රු.731,887 ක බදු කුළී මුදලක් මාස 3 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.**

**(ඇ) කඩ කාමර වසා දමා තිබීම.**

**-----------------------------**

**ප්‍රදේශයේ ජනතාවගේ පොදු උපයෝගී සේවා සැපයීම අරමුණු කර ගෙන වෙළඳ සංකීර්ණය ඉදි කර තිබුණ ද, සභාව සතු වෙළඳ සංකීර්ණ 5 ක කඩ කාමර 30 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට වසා තිබුණි.**

**(ඉ) හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීම.**

**------------------------------------------------------------**

**විධිමත් තක්සේරු වාර්තාවක් ලබා නොගෙන කඩ කාමර 48 ක බදු කුලිය 2015 වර්ෂයේ දි සභාවේ ආදායම් පරීක්ෂකවරුන් විසින් තක්සේරු කර තිබූ අතර, එම තක්සේරු බදු කුලියෙන් සියයට 50 ක් අය කිරීමට සභාව තීරණය කර ඇතත්, ඊට පරිබාහිරව 2015 ජනවාරි 1 දින, වර්ෂ 5 ක කාලයක් සඳහා සියයට 50 ක බදු කුළී අය කිරිමට ගිවිසුම්වලට එළඹීම නිසා, 2016 දෙසැම්බර් 31 දිනට සභා අරමුදලට රු.774,900 ක අලාභයක් සිදු වී තිබුණි.**

**2.2.3 වෙනත් ආදායම්.**

**-------------------**

**(අ) ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු.**

**------------------------------**

**ගලගෙදර හා හතරලියද්ද ප්‍රදේශවල ලියාපදිංචි කර ඇති ත්‍රී රෝද රථ 525 කින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,089,835 ක මුදලක් අය විය යුතුව තිබුණි.**

**(ආ) ජල ගාස්තු.**

**------------**

**2016 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටි ජල ගාස්තු රු.612,065 ක් වූ අතර, ඉන් රු.397,651 ක ශේෂයක් වර්ෂයකට අධික කාලයක සිට අය විය යුතුව පැවතුණි.**

**(ඇ) කසළ බදු.**

**-------------**

**පෞද්ගලික ආයතන 2 කින් 2015 ජනවාරි 01 දින වන විට හිඟ හිට තිබූ රු.196,000 ක කසළ බදු අය කර ගෙන නොතිබුණි.**

3. මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

3.1 කාර්යසාධනය.

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සරත් අමුණුගම ක්‍රීඩාංගනයේ ක්‍රීඩාංගන භාරකරු, සහායක හා මුරකරු වශයෙන් සේවකයින් 3 දෙනෙකු යොදවා වැටුප්, දීමනා ලෙස හා විදුලිය, ජලය සැපයීම හා ක්‍රීඩාංගණය නඩත්තුව වෙනුවෙන් එකතුව රු.1,408,796 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර ඇතත්, වර්ෂය තුළ ක්‍රීඩාංගනයෙන් උපයා ගෙන තිබුණේ රු.234,000 ක් පමණි.

(ආ) සභා අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබූ රු.1,800,000 ක් වටිනා ව්‍යාපෘති 6 ක් සඳහා වර්ෂය අවසානයේ අනුමැතිය ලබා ගෙන ඇතත්, ඉන් යෝජනා 3 ක් ඉටු කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් එක් එක් වර්ෂයන්ට අදාළ ස්වයං උත්පාදන ආදායමෙන් සියයට 30 කට වැඩි ප්‍රතිශතයක් පනතේ අරමුණු ඉටු වන ආකාරයෙන් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.20,497,248 ක පුනරාවර්තන ආදායමක් උපයා ගෙන තිබුණත්, ඉන් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණේ රු.509,142 ක් වූ සියයය 5 ක් තරම් වූ අඩු ප්‍රතිශතයකි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී 17 දෙනෙකුගේ අතිරික්තයක් හා 9 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.

(ආ) මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගෙන ගොස් තිබුණ ද, වරින් වර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග ඇතුළත් කර මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු සරත් අමුණුගම ක්‍රීඩාංගනය, ශ්‍රවණාගාරය, JCB යන්ත්‍රය හා මාර්ග තලනය කුළියට දීමෙන් 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.1,188,300 ක ආදායම් උපයා ගෙන ඇතත්, ඒ සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගෙන නොතිබුණි.

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා.**
**---------------------------**
**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ)** **2016 වර්ෂයේ දී අනවසර ඉදි කිරීම් 39 ක් හඳුනා ගෙන ඉන් 35 ක් සම්බන්ධයෙන් පළමු දැනුම්දීමක් පමණක් සිදු කර ඇතත්, නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.**

**(ආ)** **2004 වර්ෂයට පෙර සිට හා 2008, 2015 හා 2016 වර්ෂවල ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 6 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.176,694 ක සේවක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ඇ)** **2014 සිට 2016 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් 407 ක් ලැබී ඉන් අයදුම්පත් 368 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික 34 ක් පමණක් නිකුත් කර තිබුණි.**

**3.4** **මතභේදයට තුඩු දුන් ගනුදෙනු.**
**--------------------------------**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

**(අ)** **සභාවේ පරිහරණයට ලබා දී තිබූ මධ්‍යම පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයට අයත් අංක 301 – 5762 දරන මෝටර් රථය අනතුරකට භාජනය වී මධ්‍යම පළාත් අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු ඒකකය වෙත යොමු කර රු.173,120 ක ඇස්තමේන්තුවක් 2015 ජූනි 19 දින ලබා ගෙන ඇතත්, අලුත්වැඩියා කිරීමකින් තොරව 2017 අප්‍රේල් 28 දින ආපසු සභාවට රැගෙන ගොස් තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ සිදු කර අලාභය අය කිරීමට හා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ)** **හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ අංක 28 දරන කඩ කාමරය බදු දීම සඳහා හිටපු සභාපතිවරයාගේ ඍජු සම්බන්ධතා මත ටෙන්ඩර් කැඳවා රු.3,875 ක මාසික බදු කුලී මුදලකට වර්ෂ 5 ක කාලයක් සඳහා ගිවිසුම්ගතව තිබුණ ද, ගිවිසුමේ කොන්දේසිවලින් බැහැරව වැඩි මිලකට අතුරු බදු දී තිබූ අතර, ගිවිසුම්ගත මුදල ද සභාවට ගෙවීමට කටයුතු කර නොතිබුණි.**

**3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**
**-----------------------------------------**
**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) රු.29,185,519 ක් වටිනා රථ වාහන 4 ක් හා වටිනාකම හඳුනා නොගත් රථ වාහන 3 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.**

**(ආ) සභාව පවත්වා ගෙන ගොස් තිබූ බිම් ඇතුරුම් ගල් ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබූ රු.124,319 ක් වටිනා නිෂ්පාදන යන්ත්‍රයක් හා ව්‍යාපෘති භූමියේ ඉදි කර තිබූ 8'x5' ප්‍රමාණයේ කොන්ක්‍රීට් ටැංකි 6 ක් 2013 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන ස්වාභාවික ආපදාවන්ට ලක් වීමට ඉඩ හැර තිබුණි.**

**3.6 ආර්ථික නොවූ ගනුදෙනු.**
**---------------------------**
**පහත කරුණු නිරීක්ෂණය විය.**

**(අ) ගලගෙදර බස් නැවතුම් පොළ ඉදිරිපිට ඇති පෞද්ගලික ඉඩමක් පවරා ගෙන සංවර්ධනය කිරීම.**
**------------------------------------------------------------------------------------------**
**ගලගෙදර බස් නැවතුම් පොළ ඉදිරිපිට පාර්ශවකරුවන් 6 දෙනෙකුට අයත් පෞද්ගලික ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගෙන නගර සංවර්ධනය යටතේ මහජන පොළක්, ත්‍රී රෝද රථ ගාලක් හා ශාරීරික සුවතා මංතීරුවක් ඉදි කිරීමට 2013 පෙබරවාරි 26 දින පැවති මහා සභාව තීරණය කර තිබුණි. අදාළ ඉඩම් හිමියන්ගේ එකඟතාවය හා විරෝධතා කැඳවීමකින් තොරව අවිධිමත්ව ඉඩම් පවරා ගැනීමට තීරණය කර දේශීය ණය සංවර්ධන අරමුදලෙන් 2014 අගෝස්තු 26 දින රු.5,500,000 ක ණය මුදලක් ලබා ගෙන එදිනම නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පත් කර තිබුණි. එහෙත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ඉඩම පවරා ගෙන නොතිබීම හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දින වන විට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවන ලද රු.1,068,932 ක පොළී මුදල සභා අරමුදලට පාඩුවක් වී තිබුණි.**

(ආ) ගලගෙදර සුජාතා බාලිකා විදුහල ඉදිරිපිට පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම.

---

පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ රු.6,625,006 ක ඇස්තමේන්තුවක් පිළියෙළ කර, ඉදිකිරීම ආරම්භ කර 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.2,309,526 ක් වැය කර ඇතත්, ඉදිකිරීම් නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන්, ඉදිකිරීම් අතර මඟ නවතා දමා තිබුණි. එකී ඉදි කිරීම වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් රු.2,500,000 ක මුදලක් යථෝක්ත ඉදිකිරීම සඳහා යොදවා තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා පොළී මුදල වශයෙන් රු.389,779 ක මුදලක් ගෙවා තිබීමෙන් සභා අරමුදලට පාඩුවක් සිදුව තිබුණි. ඉදිකිරීම් සම්පූර්ණ නොකර අතරමඟ නවතා දමා තිබුණි.

3.7 ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.

---

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරන ලද කසළ, කළමනාකරණයකින් තොරව ට්‍රැක්ටර් 2 කින් ගලගෙදර, දික්ඔයවත්ත/ ග්‍රීන්වුඩ්වත්ත නමැති ඉඩමට බැහැර කරමින් පැවතියත්, ඊට අදාළව මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ලබා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

---

4.1 අයවැය පාලනය.

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා පූර්ව වර්ෂයේ දී යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර, කාර්මික නිලධාරීන්ගේ ඇස්තමේන්තු මත අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් සඳහා එකතුව රු.725,000 ක දළ අගයක් යොදා ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් අතර විෂයයන් 4 ක සියයට 21 සිට සියයට 68 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**-------------------------------**

**සමාලෝචිත වර්ෂයේ රු.69,763,763 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 සංයුක්ත සැළැස්ම.**

**-------------------**

**සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.4 ක්‍රියාකාරී සැළැස්ම.**

**--------------------**

**සමාලෝචිත වර්ෂයට අදාළ වන පරිදි ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.5 අභ්‍යන්තර විගණනය.**

**----------------------**

**සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.ෙ**

**5. පද්ධති හා පාලනය.**

**----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ආදායම් පරිපාලනය**

**(ආ) වත්කම් කළමනාකරණය**

**(ඇ) ණයගැතියෝ හා ණයහිමියෝ**

**(ඇ) ගබඩා පාලනය**

**(ඉ) අයවැය පාලනය**